# යටත්විජිත සමයේ ස්වදේශිකයා මුහුණ දුන් අධිකරණයේ භාෂා ගැටලුව පිළිබඳ අධ්‍යයනයක් (බැද්දේගම නවකතාව ඇසුරින්)

වයි. ඩී. ප්‍රියංකර
priyankarayd@gmail.com

**සාරසංක්ෂේපය**

රටක යුක්තිය පසිඳලීමේ ආයතනය වන්නේ අධිකරණය යි. බටහිර ජාතීන් විසින් මෙරටට හඳුන්වා දෙනු ලැබූ නූතන අධිකරණ ක්‍රියාදාමය යටත්විජිත සමයේ ක්‍රියාත්මක වූයේ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙනි. අධිකරණය විසින් ලබා දෙන දඬුවමක් යුක්තිසහගත ක්‍රියාවලියක් යටතේ ක්‍රියාත්මක බවට විශ්වාසයක් ඇති වීම සඳහා අධිකරණ ක්‍රියාවලියට සම්බන්ධ පිරිස්වලට වැටහෙන භාෂාවකින් එම තීරණ ගැනීම අත්‍යවශ්‍ය වේ. යටත්විජිත පාලන අවධියේ අධිකරණ ක්‍රියාදාමය ක්‍රියාත්මක වූයේ කෙසේ දැයි බැද්දේගම කෘතියට විෂය වී තිබේ. නවකතාවක ලක්ෂණ ප්‍රබන්ධමය වුව ද, මෙහි කතුවරයා කෘතිය රචනයේ දී එකල සමාජ පසුබිම තුළ ක්‍රියාත්මක වූ සැබෑ තත්ත්වය සිය නවකතාවට පාදක කරගෙන ඇති බව ඔහුගේ පෞද්ගලික දින සටහන් පරීක්ෂා කිරීමෙන් ද වටහාගත හැකි ය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ බැද්දේගම නවකතාව ඇසුරින් ස්වදේශික ජනයා යටත්විජිත සමයේ අධිකරණ ක්‍රියාවලියේ දී මුහුණ දුන් ගැටලු සමූහය හඳුනා ගැනීම යි. අධිකරණ ක්‍රියාදාමයේ දී යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය උදෙසා එම කටයුත්තට සහභාගි වන පිරිස්වලට වැටහෙන භාෂා මාධ්‍යයක් භාවිත වුව ද යටත් විජිත ස්වාමිවරුන් ස්වදේශික භාෂාවක් අධිකරණ ක්‍රියාදාමයට යොදාගැනීමට උනන්දු නොවූයේ මන්ද? යන පර්යේෂණ ගැටලුව කේන්ද්‍ර කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකෙරෙයි. බැද්දේගම නවකතාවේ යටත්විජිත අධිකරණ ක්‍රියාදාමය පිළිබඳ ව දැක්වෙන කරුණු, වුල්ෆ්ගේ දින සටහන් පොතේ අධිකරණ ක්‍රියාදාමය පිළිබඳ දැක්වෙන කරුණු හා මෙකල සමාජ පසුබිම තුළ අධිකරණය ආශ්‍රිත ඇති වූ ගැටලු හඳුනා ගැනීමට ලේඛනාරක්ෂක දෙපාර්තුමේන්තු ලිපි ලේඛන ආදිය කියවීම පර්යේෂණ ක්‍රමවේදය යි. මෙම පර්යේෂණය යටතේ යටත් විජිත යුගයේ ස්වදේශික ජනයා, අධිකරණ ක්‍රියාදාමයේ භාවිත කළ භාෂා ප්‍රතිපත්තිය නිසා පීඩාවට පත් වූ බව නිගමනය කෙරෙයි. මෙරට සමාජයට නව අත්දැකීමක් වූ යටත්විජිත අධිකරණ ක්‍රියාවලිය සඳහා ආදේශ කළ හැකි භාෂා ප්‍රස්තරයක් නොතිබීමත්, රජයේ ආයතනවල ඉංග්‍රීසියෙන් කටයුතු කිරීම භාෂා ප්‍රතිපත්තිය වීමත්, අධිකරණ ක්‍රියාදාමය පොදු භාෂා ප්‍රතිපත්තියට වඩා ස්වදේශිකයාගේ ජන ජීවිත කෙරෙහි ඍජු ව බලපාන ක්ෂේත්‍රයක් බව හඳුනා නොගැනීමත් යන ගැටලු මෙම පසුබිමේ තිබේ. දේශපාලන අයිතිවාසිකම්වලින් සමාජ ක්‍රමයෙන් බලගැන්වෙන පසුබිම දී පොදුජන අයිතිවාසිකම් කේන්ද්‍ර කරගත් දේශපාලන ක්‍රියාකාරකම් සමාජයේ උත්සන්න වීමත් හේතු කොටගෙන අධිකරණ ක්ෂේත්‍රයේ මෙම ගැටලුව සමාජ කතිකාවක් බවට පත් වී ඇති බව ද පර්යේෂණයේ සොයාගැනීම් වේ.

**ප්‍රමුඛ පදඃ** අධිකරණය, බැද්දේගම , යටත් විජිත සමාජය, ස්වදේශිකයා

# Language Barrier Faced by Natives in Colonial Courts: A Study Based on 'The Village in the Jungle'

Y. D. Priyankara
priyankarayd@gmail.com

**Abstract**

The judiciary plays a pivotal role in upholding law and justice within any nation. During the British colonial period, the judicial system introduced to Sri Lanka operated exclusively in English. To foster trust and confidence in the judgments delivered, it is imperative to conduct judicial proceedings in a language understood by the citizens. 'The Village in the Jungle', is a novel that provides a glimpse into how the judicial process unfolded during colonial times. While a novel is a work of fiction, the author's journal records suggest that he drew inspiration from the actual circumstances of contemporary society. This research endeavors to identify and analyse the challenges confronted by native communities due to language barriers within the court system. While the importance of employing a language comprehensible to citizens in the judicial process is acknowledged, this study delves deeper into the question of why colonial authorities were hesitant to adopt native languages for judicial purposes. Drawing data from a content analysis of 'The Village in the Jungle', Leonard Wolf's journal entries, and archived documents, this study sheds light on the difficulties faced by native communities in the judicial processes due to language barriers during colonial times. The findings of this study reveal that native communities encountered significant difficulties during the colonial era due to language policies in the judicial process. Several underlying causes of this, such as the absence of an adaptable native language stratum for colonial judicial proceedings, English serving as the working language in all government institutions, and a failure to recognise the judicial process as a matter impacting the lives of ordinary citizens, rather than just a component of general language policy, are recognised by this study. Additionally, this study reveals that political movements advocating for the rights of ordinary citizens and community empowerment contributed to the emergence of a discourse regarding this issue within the contemporary society.

**Keywords:** Colonial society, Courts, Justice, Native communities, The Village in the Jungle,